ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2247/17 - 2021 සැප්තැම්බර් මස 29 වැනි බදාදා - 2021.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 24/51(VII)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වන වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝගය.

පවිත්‍රා වන්නිආරච්චි,
ප්‍රවාහන අමාත්‍ය.

2021 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2021 අප්‍රේල් මස 1 වන දින අංක 2221/57 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2021 අංක 1 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර වලංගු කාලසීමාව තාවකාලික දීර්ඝ කිරීමේ) නියෝග, එහි 2 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"2. (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ VII වන කොටස යටතේ මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කර ඇති :-

(අ) එම රියදුරු බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි, 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී 2021 සැප්තැම්බර් මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ නිශ්චිත දිනයේ දී කල් ඉකුත්වීමට නියමිත සෑම රියදුරු බලපත්‍රයකම වලංගු කාලසීමාව එකී කල් ඉකුත්වීමේ දින සිට මාස දොළහක් (12) මෙයින් දීර්ඝ කරනු ලැබේ ;

(ආ) එම රියදුරු බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි, 2021 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වී 2022 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ නිශ්චිත දිනයේ දී කල් ඉකුත්වීමට නියමිත සෑම රියදුරු බලපත්‍රයකම වලංගු කාල සීමාව එකී කල් ඉකුත්වීමේ දින සිට මාස හයකින් (6) මෙයින් දීර්ඝ කරනු ලැබේ."

10 - 114

1A - PG 5553 — 520 (2021/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*